# පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.

ජේ. වරීතරූසා ( තාක්ෂණ නිලධාරි)
අධ්‍යාපන හා පුහුණු අංශය.

## හැඳින්වීම.

කෘෂිකර්ම ව්‍යාප්ති කාරකයන් සඳහා පුහුණු කිරීමේ අවශ්‍යතාවය වැඩිවෙමින් පවතී. කෘෂිකර්ම තාක්ෂණයේ ඇති අනවරත වෙනස්වීම් සහ කෘෂි ආර්ථිකයේ ස්වභාවය අනුව නිෂ්පාදන සහ විකුණුම් රටාව නැවත නැවතත් [illegible] සකස් වීමට භාජනය වෙයි. අද පුහුණු පා ඇති තත්වය අනුව පුහුණුව සඳහා වැඩි ඉල්ලුමක් ඇති අතරම, මෙම පුහුණුවේ ගුණාත්මක අගය වැඩි දියුණු කිරීම උදෙසාද කරන හඬගැම් සෑම පැත්තකින්ම ඇසේ. පුහුණු වැඩ සටහන් සඳහා අධික වියදම් දැරීමට සිදුවන හෙයින්, අඩු ගුණාත්මක අගයෙන් යුත් එබඳු පාඨමාලා නිකරුණේ සම්පත් විනාශ කිරීමක් වෙයි. පුහුණු පාඨමාලා හැඩ ගැසී ඇත්තේ, ලබාගත හැකි ප්‍රවෘත්ති සහ තාක්ෂණික දැනුම මත වන අතර මේ නිසා "පුහුණු කරවන්නන්" බොහෝ විට නොදැනුවත්වම විෂයගත දැනුමට පමණක් සීමාවී උගුලකට හසුවූවන්ගේ තත්වයට පත්වේ. එය එම එම පාඨමාලාවේ ගුණාත්මක අගය හීන වීමට හේතුවෙති. පුහුණුව සාර්ථක වන්නේ, සැලසුම් කළ කණ්ඩායම් වලින් හඳුනාගත් විශේෂ වූ පුහුණු අවශ්‍යතා මඟින් පාඨමාලා සැකසීමෙනි, මෙම ලිපියෙන් සාකච්ඡා කෙරෙන හඳුනා ගන්නා නිශ්චිත ක්‍රම සමහරක් මඟින් පුහුණු කරවන්නන් හට තමන්ගේ පාඨමාලාවල තත්වය වැඩි දියුණු කරගත හැකි වනු ඇත.

## උගැන්වීමේදී උගුලට හසුවීම.

පුහුණු වන්නන් දැනටමත් දන්නා යමක් උගැන්වීමේදී හෝ ඔවුන් හට අවශ්‍ය කරන යමක් උගැන්වීමට අපොහොසත් වන අවස්ථා වලදී හෝ පුහුණු කරවන්නා නොදැනීම උගුලකට හසුවේ. මේ නිසා පුහුණුවේ ගුණාත්මක අගය බොහෙවින් හීනවන අතර පුහුණු වෙන්නා තුල අවශ්‍යයෙන්ම තිබිය යුතු අවධානයද නැතිවී යයි. සේවා සංස්කරන පුහුණුවකදී මෙම තත්වය පහසුවෙන්ම ඇති වන්නේ ඒකාකාරී පාඨමාලා

වන්ට කන්දීමෙන් සහ එකිනෙකා නිතර නිතර දැන හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි. පුහුණුව සහ හමුවීම් යටතේ පැවැත්වෙන සහ සහභාගිවන පාඨමාලා වල ගුණාත්මක අගය අඩු වුවද රාජකාරි මය අවශ්‍යතාවය නිසා එයට සහභාගිවීම අනිවාර්ය හෙයින් ඒ ගැන එතරම් තැකීමක් නොකරයි.

## පුහුණු අවශ්‍යතා හැඳින ගැනීම.

ගුණාත්මක අගයෙන් යුත් පාඨමාලා සැකසිය යුතු වන්නේ පුහුණු අවශ්‍යතා වලට එකඟ වන පරිදි විය යුතු අතර මෙහිදී "උගුල් වලට හසුවන" තත්වයෙන් වැළකිය යුතුය. ප්‍රවෘත්ති නැවත නැවතත් සඳහන් කිරීම යල් පැන ගිය ක්‍රමයක් වන මුත් එය වෙනස් අයුරකින්; එනම් ගැටළු විසඳීමෙන් හෝ වෙනත් යමකට ආරෝපණය කර හෝ ඉටු කර ගත හැක. එමගින් උගුලට අසු නොවේ. ප්‍රතිඵල ගෙන දෙන පුහුණු පාඨමාලාවක් සකස් කිරීමේ පළමු පියවර වන්නේ නිවැරදි ලෙස පුහුණු අවශ්‍යතා තේරුම් ගැනීමයි. එක් වැඩ මුළුවකදී, පුහුණු කර- වන්නන් විසින් පුහුණු අවශ්‍යතා හැඳින ගැනීමේ මාර්ග ලෙස පහත දැක්- වෙන ක්‍රම පෙන්වා දෙන ලදී.

1. සැලසුම් කළ කණ්ඩායම් සමඟ සාකච්ඡා කිරීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ සමීක්ෂණයක් කිරීම සහ ඔවුන් වැඩෙහි යෙදී සිටින අවස්ථාවන් නිරීක්ෂණයට ලක් කිරීම.
2. එම කණ්ඩායමේම අධීක්ෂකයින් සමඟ සාකච්ඡා කිරීම, සම්මුඛ පරීක්ෂණ තැබීම සහ සමීක්ෂණය කිරීම.
3. එම කණ්ඩායමේ ගනුදෙනුකරුවන්, එනම් ගොවීන්, කෘෂිකර්ම උපදේශක හෝ කෘ.ව්‍යා.ලේ. වරුන් සමඟ ඉහත දැක්වෙන සාකච්ඡා පැවැත්වීම.
4. ප්‍රතිපත්ති, සැලසුම්, ව්‍යාපෘති සහ තාක්ෂණයන්ගේ වෙනස්වීම් වලට අනුරූපව සංවිධානයේ, ක්‍රමයේ මෙන්ම රාජකාරි ස්ව- භාවයේ සහ අන්තර්ගතයේ වෙනස්වීම් ඇති කිරීම.

විවිධ ස්වභාවයේ වෙනස්වීම් සඳහා ඒවාට විශේෂණය වූ පුහුණු අවශ්‍යතා අවශ්‍ය බව අවසාන කරුණෙන් හැඟුනත්, අනික් කරුණු 3 ම එබන්දක් පෙන්වන්නේ නැත. ඒවා සියල්ලම පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමේ සාමාන්‍ය උපක්‍රම වන අතර එම අවශ්‍යතා සඳහා විෂයගතව යොදා ගත හැකි කරුණුය. මෙම උපක්‍රම උපයෝගී කර ගෙන පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමෙන්, තම ප්‍රියතම විෂය වඩා හොඳින් උගැන්වීමට පුහුණු කරවන්නාට හැකිවනු ඇත. මෑතකදී එක් තරුණ විෂයානුගත විශේෂඥයෙකුට තම ප්‍රශ්න පත්‍රයකින් හෙළි වූයේ, එම දිස්ත්‍රික්කයේ කෘ.ව්‍යා.සේ. වරුන්ට පාංශු රසායන විද්‍යාව පිළිබඳ පරීක්ෂණයක් අවශ්‍යව ඇති බවයි. මේ සඳහා ඔහු කටයුතු සැලැස්වූ අතර – එම ප්‍රදේශයේ විශ්ව විද්‍යාලයක් මගින් අවශ්‍ය පුහුණුව ලබා දෙන ලදී. විභාග වලින් සමත්වීම සඳහා යටත් කෘ. ව්‍යා.සේ. වරුන්ට එම පුහුණුව ප්‍රයෝජනවත් විය හැකි වුවත්, ප්‍රදේශයේ ගොවීන් ලවා නිර්දේශිත වගා ක්‍රම ක්‍රියාවේ යෙදවීම සඳහා එය කෙතෙක් දුරට ඉවහල් වේද?

පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම ස්වභාවයෙන්ම ගැටළු සහගත වන අතර, එම "ඉලක්කයන්" සහ "ඉලක්කය කරා ලඟා වීම" පිළිබඳව පැහැදිලි බවක් සමෙකු තුල තිබිය යුතුය. වෘත්තීය පුහුණුව සඳහා වන පුහුණු අවශ්‍යතා, ව්‍යාප්ති කාරකයන්ගේ පුහුණු අවශ්‍යතා වලින් සම්පූර්ණයෙන්ම වෙනස්ය.

<u>වෘත්තීය පුහුණුවකදී අවශ්‍යවන පුහුණුව.</u>

වෘත්තීය පුහුණුවක සාර්ථකත්වය රඳා පවතින්නේ, එම පුහුණු වන්නා තුල පවතින දැනුමේ සහ දක්ෂතාවල කාර්යක්ෂමතාවය අනුවය. එබැවින් වෘත්තීය පුහුණුවකදී (උදා:- මේසන්, වඩු, යාන්ත්‍රික හෝ විදුලි ශිල්පී) එම වෘත්තියේ ස්වභාවය සහ පුහුණු වන්නා තුල එම කාර්යය පිළිබඳව දැනට ඇති දක්ෂතාවය සහ දැනුම සහ ඒ සම්බන්ධව ඔහු විසින් ලබා ගත යුතු ප්‍රශස්ථ දැනුම අතර වෙනස ඔහුගේ පුහුණු අව-ශ්‍යතාවයයි. ඔහුගේ දැනුමේ සහ දක්ෂතාවයේ වර්ධනයක් සමග එම

වෘත්තිය පිළිබඳ ඔහුගේ සාර්ථකභාවයද වර්ධනය වනු ඇත. ලබා දුන් පුහුණුවේ ගුණාත්මක අගය, පසු විමසුමකින්ද තක්සේරු කළ හැක. දැනුම සහ පුහුණුව ලබාගත් ඔහුටම, තමා ලැබූ අධ්‍යාපනය සම්බන්ධව පසු විමසුම් තොරතුරුද ලබාදිය හැක. අනාගත පුහුණු අවශ්‍යතා පිළිබඳ තොරතුරුද ඔහුට ලබාදිය හැක.

## ව්‍යාප්ති කාරකයන් සඳහා පුහුණු අවශ්‍යතා.

වෘත්තිය ස්වභාවය හෝ අවශ්‍යතාවය අනුව ව්‍යාප්ති කාරක-යන්ගේ පුහුණු අවශ්‍යතා හැඳින ගත නොහැක. එයට හේතුව පුහුණු පන්ති වලදී ලබාදෙන දැනුම සහ පුහුණුව අවසානයේදී ප්‍රයෝජනයට ගනු ලබන්නේ ගොවීන් වන බැවිනි. ව්‍යාප්ති කාරකයන්ගේ දැනුම සහ දක්ෂතාවයන් පරීක්ෂාවට ලක් කොට, හඳුනා ගන්නා පුහුණු අවශ්‍යතාවයන් බොහෝ වෙනස් ස්වරූපයක් ගන්නේ, ගොවීන් තුළ ඒ සම්බන්ධව ඇති අනවබෝධය නිසාත්, ඔවුන්ට ඒවා උගැන්විය යුතුවීමත් නිසාය. ව්‍යාප්ති කාරකයන් හට ලබා දෙන පුහුණුව වඩා හරවත් වීමටත්, එමගින් වඩා උසස් නිෂ්පාදනයක් ලබා ගැනීමටත් බලාපොරොත්තු වන්නේ නම්, පුහුණු අවශ්‍යතා හඳුනා ගත යුත්තේ, ගොවියා ඒ ඒ කරුණු සම්බන්ධව දක්වන ආකල්ප අනුවය.

1983 වර්ෂයේදී එක්සත් රාජධානියේ වුල්වහැම්ප්ටන් බහුතාක්ෂණික විද්‍යාලය මගින්, අපරට තුළ පවත්වන ලද "පුහුණු කරවන්නන් සඳහා පුහුණුව" පිළිබඳ වැඩ මුළුවකදී, ව්‍යාප්ති කාරකයන්ගේ පුහුණු අවශ්‍යතාවයන් තක්සේරු කරන ලද්දේ, ගොවීන්ගේ එම අවශ්‍යතා හඳුනා ගැනීමෙනි. දුර්වල වගා පාලන ක්‍රම දර්ශකයක් ලෙස භාවිතා කරමින්, ගොවීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගත් අතර එමගින්ම, ගොවීන්ට උපදෙස්දීම හා පුහුණු කරවීම සඳහා ව්‍යාප්ති කාරකයන්ට අවශ්‍ය වන පුහුණුවද හඳුනා ගන්නා ලදී. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමේ මෙම ක්‍රමය (එනම් දුර්වල වගා පාලන ක්‍රම දර්ශකය ලෙස යොදා ගැනීම) විශේෂයෙන්ම සංවර්ධනය වන රටවලදී එතරම් හොඳ මිනුමක් නොවේ. එයට හේතුව නිර්දේශිත වගා ක්‍රම භාවිතාවීම සීමාකාරී වන

නොයෙකුත් බාධක (දැනුම සහ ශිල්පීය ඥානය කොතෙකුත් තිබුණත්) එනම් යෙදවුම් සීමාකාරීවීම සහ සමාජමය ප්‍රශ්න ඇතිවීමයි. එබැවින් පාඨමාලාවන් සංවර්ධනය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී මෙම දර්ශනය භාවිතාවෙන් හඳුනාගත් අවශ්‍යතා වැරදි මෙන්ම ගුණාත්මක අගයෙන් හීනවීමටද ඉඩ ඇත.

පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමේ එක් ක්‍රමයක් නම්, නිෂ්පාදන කාර්යාවලිය සඳහා නිර්දේශිත ක්‍රම පවත්වා ගෙන යාමට ඇති බාධක හඳුනා ගැනීම සහ ගොවියාගේ දැනුම සහ ශිල්පීය පුහුණුව මදි කම නිසා මෙසේ සිදුවන්නේදැයි සොයා ගැනීමයි. යෙදවුම් සීමාකාරීවීම සහ සමාජීය බලපෑම් හේතුවෙන් නිර්දේශ කරන නිෂ්පාදන රටාවන් පැවැත්වීමට දුෂ්කරතා ඇතිවන විටක, එබඳු නිර්දේශ ගැන යලි යලිත් පුහුණුවක්දීම ප්‍රතිඵල විරහිතය. එම සීමාකාරී සාධක පළමුව ඉවත් කර ඉන්පසු පුහුණුව ලබාදිය යුතුයි. යම් භෝගයකට හෝ ප්‍රදේශයකට උචිත පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් කරන්නේ නම් ඒ සඳහා සහාය දක්වන අයුරු ආකෘති පත්‍රයක් සකස් කර ගතහැකිය.

උදා:- ඒ නිෂ්පාදනය.

| නිර්දේශිත නිෂ්පාදන රටාව | භාවිතා නොවීමට හේතු | | | | පුහුණු අවශ්‍යතා |
|---|---|---|---|---|---|
| | අඩු දැනුම | පළපුරුද්ද අඩුවීම | යෙදවුම් සීමාකාරී වීම | සමාජීය බාධක | |
| | | | | | |

ව්‍යාප්ති කාරකයෙකුගේ දුර්වල දැනුම සහ ශිල්පීය ඥානය වර්ධනය කරවීමේ අරමුණින්, ඔහු පුහුණු කරවීමෙන්, ගොවියෙකුගේ කුසලතා වර්ධනය සඳහා එය උපකාරී නොවෙයි. මේ සඳහා ව්‍යාප්තිකාරකයා පුහුණු කරවිය යුතු වන්නේ, ගොවියාට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා දීමට හැකිවන පරිදි — ගොවියාගේ අවශ්‍යතාවයන් වටහාගෙනය. ව්‍යාප්ති අවශ්‍යතාවය යනු, ගොවියාගේ අවශ්‍යතා ඉටු කරදීම බැවි අවබෝධ කර ගැනීම ඉතා වැදගත්ය.